[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 09 ශ්‍රේණිය | විෂයය - භූගෝල විද්‍යාව | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................

### I කොටස

**ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01) ලෝකයේ වඩාත්ම උසම කඳු ශිඛරය වන ......................................... කඳු මුදුන ආසියා මහද්වීපයේ පිහිටා ඇත.
(ඇට්ලස් ,එවරස්ට්,රොකී )

02) ආසියා මහද්වීපයේ පිහිටි අමූර්, හොවැංහෝ සහ යැනංසි යන ගංගා ගලා බසින්නේ.......................... සාගරයටය.
(පැසිපික්, අත්ලාන්තික්, ඉන්දියන්)

03) ශ්‍රී ලංකාවේ පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා දිග ............. Km කි.
( 224, 432, 424)

04) ඕක්, මල්බෙරි, චෙස්නට්, පයින් හා යුකැලිප්ටස් වැනි විශේෂිත ශාක වර්ග දක්නට ලැබෙන්නේ ................. කලාපයේය.
( නිවර්තන, සෞම්‍ය, ශීත)

05) ශ්‍රී ලංකාවට නිරිතදිග මෝසම් වර්ෂාව ලැබෙන්නේ........................................ දක්වා කාල වකවානුවේදීය.
(මැයි සිට සැප්තැම්බර්, දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා, ජනවාරි සිට මාර්තු)

**ප්‍රශ්න අංක 06 - 10 දක්වා දී ඇති වගන්ති හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් ✗ ලකුණ ද, ප්‍රශ්න ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

06) ලෝකයේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ ඉන්දියාවේ මෙගාලයා ප්‍රාන්තයේ පිහිටි චෙරාපුංජි ප්‍රදේශයටය. (   )

07) කේතුධර වනාන්තර දකින්නට ලැබෙන්නේ ශීත දේශගුණයක් පවතින ප්‍රදේශවලය. (   )

08) පාකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික වගා ඍතු දෙක වසන්ත සහ සිසිර ලෙස හඳුන්වනු ලබයි. (   )

09) ඩුබායි රටේ ජාත්‍යන්තර සන්නිවේදන සේවා මධ්‍යස්ථානය CNN , AL JAZEERA ලෙස හඳුන්වයි. (   )

10) කලපු හා මෝය ආදී වෙරළ ආශ්‍රිත ප්‍රදේශවල එරමිණියා, පතොක් හා පලු වැනි කඩොලාන ශාක ව්‍යාප්ත වී ඇත. (   )

**අංක 11 සිට 15 දක්වා වගන්තිවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් මත ලියන්න.**

(මාලිබොඩ, හැටන්, වෙරළබඩ, මුලතිව්, වැලිමඩ, මළ මුහුද, ගම්පහ)

11) මුහුදු මට්ටමට වඩා පහළින් පිහිටි .................................. ද ආසියානු ගොඩබිම් ප්‍රදේශයේ පිහිටා ඇත.

12) මධ්‍යම කඳුකරයේ භූ විෂමතා කලාපයේ පිහිටි …………….....… සානුව සමනල කන්ද ආසන්නයේ දක්නට ලැබේ.

13) ශ්‍රී ලංකාවේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ ………….........… නම් ස්ථානයට ය.

14) භෞතික පරිසරය උපයෝගී කරගනිමින් බිහි වන හුණුගල්, ලුණු වැනි කර්මාන්ත සිදු කරන්නේ………………………….. කලාපයේය.

15) ශ්‍රී ලංකාවේ අඩුම ජන ව්‍යාප්තියක් පෙන්නුම් කරන්නේ……………..…………….දිස්ත්‍රික්කයේය.

**ප්‍රශ්න අංක 16 සිට 17 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16) ඉන්දියාව, ශ්‍රී ලංකාව යන රටවල්වල පැතිර පවතින දේශගුණ වර්ගය ලෙස සැළකේ සැලකෙන්නේ,

1). උෂ්ණ කාන්තාර දේශගුණය යි    2).තෙත් සෞම්‍ය දේශගුණය යි
3).කඳුකර දේශගුණය යි    4).නිවර්තන මෝසම් දේශගුණය යි.

17) මුහුදු ගුහාවක් තුළින් ශබ්දයක් නගමින් ජලය ඉහළ විහිදීම නිසා නිර්මාණය වී ඇති දැකුම්කළු ස්ථානයකි.

1).රුමස්සල    2).හුම්මානය
3).සීනිගම    4).නිලාවෙලි

18) පහත සඳහන් ප්‍රශ්නවලදී **"අ"** තීරුවේ දක්නට ලැබෙන තොරතුරු **"ආ"** තීරුව හා නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර වන්නේ,

| **අ** | **ආ** |
|---|---|
| 1.රක්වාන කඳු, බුලුතොටහෙල් | A.ශේෂකඳු |
| 2.මිහින්තලය, සීගිරිය | B.සමාන්තර හෙල්වැටි |
| 3.මීගමුව, පුත්තලම | C.දූපත් |
| 4.මන්නාරම, ඩෙල්ෆ්ට් | D.කලපු |

1). BCAD    2). BDCA    3). BADC    4). CADB

19) රටක ආර්ථිකයේ එක් එක් අංශ **"අ"** තීරුවේ ද එම අංශවලින් ආසියාවේ ප්‍රමුඛත්වය ගත් රටවල් **"ආ"** තීරුවේද දැක්වේ.

| **අ** | **ආ** |
|---|---|
| 1.කාර්මික | A.ඩුබායි |
| 2.සේවා | B.පාකිස්ථානය |
| 3.කෘෂිකාර්මික | C.ජපානය |
| | D.ශ්‍රී ලංකාව |

1). ABC    2). CBA    3). CAB    4).CDA

20) ජන වර්ග අනුව ජන සංයුතිය නිවැරදිව දැක්වීම **"අ"** සහ **"ආ"** තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,


| අ | ආ |
|---|---|
| 1.සිංහල | A) 11.2 |
| 2.ඉන්දීය දෙමළ | B) 9.2 |
| 3.ශ්‍රී ලංකා දෙමළ | C) 4.2 |
| | D) 74.9 |

1). ABC 2). BCA 3). CDA 4).DCA

**(ලකුණු 2 × 20 = 40)**

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරක් තෝරාගෙන මුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**




01). (I)

1). "A" අක්ෂරයෙන් දැක්වෙන මුහුද නම් කරන්න.
2). "B" අක්ෂරයෙන් දැක්වෙන ගංහාව නම් කරන්න.
3). "C" අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක්ද?
4). "D" අක්ෂරයෙන් දැක්වෙන රට නම් කරන්න.
5). "E" අක්ෂරයෙන් සඳහන් වන සමුද්‍ර සන්ධිය කුමක්ද?
6). කොකේසස් කඳු දැක්වෙන අක්ෂරය ලියා දක්වන්න. (ලකුණු 06)


(II)

7). ආසියාවේ වර්ග කි.මීටරයකට සාමාන්‍ය ජන ඝනත්වය කොපමණ ප්‍රමාණයක්ද?
8). ආසියාවේ අඩුම ජන සංඛ්‍යාවක් වෙසෙන රටවල් දෙක සඳහන් කරන්න.
9). කඳුකර තෙත් කලාපීය වනාන්තර ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ දෙකක් නම් කරන්න.
10). යාපනය ප්‍රදේශයේ වැවෙන ශාකයක් වන "තල්" ගස ආශ්‍රිත නිශ්පාදන දෙකක් ලියන්න.
11). ශ්‍රී ලංකාවේ සමස්ත ජන සංඛ්‍යාවේ ආයු අපේක්ෂාවේ අගය කීයද? (ලකුණු 2 × 5 =10)

02).

I).ආසියා මහද්වීපයට අයත් විශාල දූපත් දෙකක් ලියන්න. (ලකුණු 02)
II).ආසියානු ප්‍රදේශයේ වාසය කරනු ලබන ප්‍රධාන මානව වර්ග දෙක නම් කරන්න. (ලකුණු 04)
III).ලෝකයේ ප්‍රධාන කාර්මික රටක් ලෙස ජපානය හැඳින්වීමට හේතු පහක් සඳහන් කරන්න.
(ලකුණු 05)

03).පහතින් දැක්වෙන ශ්‍රී ලංකා සිතියම අදාල කරගෙන පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



I).අංක 1න් හා 2න් දැක්වෙන භූ විෂමතා කලාප නම් කරන්න. (ලකුණු 02)

II).අංක 1න් දැක්වෙන කලාපයේ A,B,C,D අක්ෂර වලින් සඳහන් ස්ථානවල ඇති භූ ලක්ෂණ මොනවාදැයි ලියා දක්වන්න.

1). ත්‍රිකුණාමලය -
2). කල්පිටිය -
3). මන්නාරම -
4). දෙවුන්දර - (ලකුණු 04)

III).ශ්‍රී ලංකාවේ ජලවහන රටාවේ පැතිරීම අනුව මෙරට ආර්ථිකයට ඇති වාසි සහගත කරුණු කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

04).

I).කාලගුණය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

II).උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් වලට බලපාන සාධක දෙකක් ලියන්න. (ලකුණු 04)

III).ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප දෙකක් නම්කර ඒ පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

05).

I).ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ තොරතුරු ලබා ගන්නා ආයතනය කුමක්ද? (ලකුණු 02)

II).මෙරට ජන ව්‍යාප්තියේ අසමානකම් ඇති වීමට බලපා ඇති හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

III).ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ඇති වී ඇති වෙනස්කම් පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

06).

I).ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවල වගා කෙරෙන ප්‍රධාන වගාවන් දෙකක් ලියන්න. (ලකුණු 02)

II).මෙරට කඳුකර කලාපයේ සිදුකෙරෙන මානුෂ ක්‍රියාකාරකම් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

III).අප රටේ භෞතික පරිසරයට මිනිසාගෙන් සිදුවන හානි පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

07).

I).සාක්ෂරතාව යනු කුමක්දැයි කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 02)

II).රටක සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන දර්ශක දෙකක් ලියන්න. (ලකුණු 04)

III).ඔබ ප්‍රදේශයේ සිදුවන පරිසර හානි දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් ලියා දක්වන්න. (ලකුණු 05)

## භූගෝල විද්‍යාව 09 ශ්‍රේණිය I කොටස - පිළිතුරු

| | |
|---|---|
| 1.එවරස්ට් | 11.මළ මුහුද |
| 2.පැසිපික් | 12.හැටන් |
| 3.4,32 | 13.මාලිබොඩ |
| 4.සෞඛ්‍යය | 14.වෙරළබඩ නැති |
| 5.මැයි සිට සැප්තැම්බර් | 15.මුලතිව් |
| 6. ✓ | 16.4 |
| 7. ✓ | 17.2 |
| 8. × | 18.3 |
| 9. ✓ | 19.3 |
| 10. × | 20.4 |

## II කොටස

1)

I).කළු මුහුද

II).ඇමේසන්

III). මැඩගස්කරය

IV). ජපානය

V). පෝක් ස.ස

VI). G

VII).500ට වැඩි වර්ග කිලෝමීටර්

VIII).ටිමෝර්,බහරේන්

IX).සමනලකන්ද, පිදුරුතලාගල, නකල්ස්, හෝර්ටන් තැන්න,

X).හකුරු, රා, පැණි, කෝටු

XI).74.2

02).

I).ජපානය, ඉන්දුනීසියාව

II).මොන්ගොලොයිඩ්, කොකසොයිඩ්

III).දළ ජාතික නිෂ්පාදනයේ 27.5%  කර්මාන්ත අංශය විසින් හිමිකරගෙන තිබීම.

ශ්‍රම බලකායෙන් 26.2% ක් කාර්.අංශයෙන් රැකියාවල නියුක්ත වීම

මෝටර් රථ නිෂ්.ප්‍රමුඛයා වීම

විවිධ ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න